වෙළුම අංක 19 කලාපය. 01 ජුනි 2024

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය
IN FORMATION



# මනුෂ්‍යයෙකු වීම බයිබලය තුළින් තේරුම් ගැනීම



## මනුෂ්‍යයෙක් වීමේ තේරුම කුමක්ද?

**මෙය අපගේ යුගයේ වඩාත්ම දැවෙන ප්‍රශ්නයයි.**

විදුහල්පතිතුමාගේ පණිවිඩය

අයිවෝ පූබාලන්, PhD
විදුහල්පති

'මනෝවිද්‍යාත්මක වර්ගීකරණ සහ ඇතුළාන්තය වෙත යොමුවීම නූතන පුද්ගලයාගේ සුවිශේෂී ලක්ෂණයකි' යන අදහස ආන්දෝලනාත්මක ලෙස ලෝකය වෙනස් කරමින් පවතී. ඉන්, 'විකාශිත පුද්ගලවාදය' නැමැති නවතම සංසිද්ධිය හරහා, උදාහරණයක් ලෙස, 'කෙනෙක් පාසල, දේවස්ථාන වැනි ආයතන වලට යන්නේ රඟන පිණිස මිස හැදෙන පිණිස නොවේය' වැනි අදහස් ඉදිරියට රැගෙන විත් ඇත. පුද්ගල සහභාගිකත්වය අගයන පොදු ප්‍රජාවක් ලෙස තේරුම්ගෙන තිබුණු සංස්කෘතිය මේ වන විට කණපිට හැරී ඇත. නූතන මනුෂ්‍යයෙකු වීමේදී, ඒක පුද්ගල විශ්වාසයන් සහ රුචිකත්වයන් වලට ප්‍රමුඛස්ථානය ලැබී ඇති බැවින්, සම්ප්‍රදායන් සහ ආයතන වලින් අපේක්ෂා කරන්නේ, හුදෙක් ඒක පුද්ගල විශ්වාසයන් තහවුරු කර ඊට අනුරූප වීමය (Carl Trueman, The Rise and Triumph of the Modern Self). අනන්‍යතාව පිළිබඳ අපගේ අවිනිශ්චිතභාවයට මුල් වන මෙම වෙනස, නිතැතින්ම, ස්ත්‍රී පුරුෂ භාවය සහ ලිංගිකත්වය පිළිබඳ අපගේ චින්තනයේ විශාල කැලඹීම් ඇති කර ඇත. පුරුෂයින් සහ ස්ත්‍රීන් ලෙස ලිංගභේදය ගැන කතා කිරීමේ සිට, ගණන් කළ නොහැකි තරම් ලිංගභේද තිබිය හැකිය යන අදහස දක්වා අද අපි වෙනස් වී ඇත. ලිංගිකත්වය ගැන කතා කිරීමේදී, ඔහුට හෝ ඇයට හිතෙන අන්දමට, හොඳ සහ නිවැරදි ලිංගික හැසිරීම් මොනවාදැයි තීරණය කිරීම එක් එක් පුද්ගලයාට භාර දී ඇත.

වැඩිදුර කියවන්න

## දේවධර්ම ශාස්ත්‍රාලය, වසර 30ක් පුරා, ක්‍රිස්තුස් වහන්සේ වැනි නායකයින් නිර්මාණය කිරීම සමරයි

සභාව තුළ මෙන්ම ව්‍යාපාරික ලොව තුළත්, සාර්ථක සේවයක නියැලීමේ හැකියාව ඇති, ක්‍රිස්තුස් වහන්සේ වැනි නායකයින්, ශ්‍රී ලංකාවේ සභාවට දායාද කර දීමට කැපවුණු, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය, කොළඹ මධ්‍යයේ, අන්තර්-නිකායික, ත්‍රිභාෂා ශාස්ත්‍රාලයක් ලෙස කටයුතු කිරීම අරඹා 2024 මැයි 31 දිනට 30 වසරක් සපිරේ.

# ඉගෙන ගන්නා ප්‍රජාව පෝෂණය කිරීම

## දේවධර්ම අධ්‍යාපනයේ පරිවර්තනය




### ආචාර්ය පෙරී ෂෝ සමඟ දෙදිනක ගුරු සංවර්ධන සම්මන්ත්‍රණය

"දේවධර්ම අධ්‍යාපනයේ පරිවර්තනය" යන මැයෙන්, ආචාර්ය පෙරී ෂෝ විසින් පවත්වන ලද සම්මන්ත්‍රණය, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාල ගුරු මණ්ඩලයට මහත් ආශීර්වාදයක් විය. අප්‍රේල් 3 සහ 4 යන දිනවල පැවති මෙම සම්මන්ත්‍රණයේදී, වැඩිහිටි අධ්‍යාපනයේ විවිධ අංශ විමර්ශනයට ලක් කෙරිණි.

## දේවධර්ම විද්‍යාල සඳහා ම විශේෂයෙන් නිමවුණු නව විද්‍යුත්-පොත් පීඨය (E-BOOK PLATFORM) ගවේෂණය



### විද්‍යුත් දේවධර්ම පොත් ජාලයේ (E-TBN) පුස්තකාල පහසුකම් සම්බන්ධයෙන් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාල ගුරු මණ්ඩලය පුහුණු කිරීම

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ මිත්‍රයෙකුගේ ත්‍යාගශීලී දීමනාවක් තුළින් E-TBN පොත් එකතුව වෙත පිවිසීමේ අයිතිය පුස්තකාලයට ලැබී ඇත. මෙහි ආචාර්ය විනෝද් ගුණසේකර (හිටපු නියෝජ්‍ය විදුහල්පති) කොළඹ දේවධර්ම ශාස්ත්‍රාල ගුරු මණ්ඩලයට සහ ශාස්ත්‍රපති උපාධි අපේක්ෂක සිසුන්ට ඒ ගැන පුහුණුවක් ලබා දෙන අන්දම දැකිය හැකිය. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාල ගුරු මණ්ඩලයට සහ සිසුන්ට ඕනෑම තැනක සිට, විචාරාත්මක දේවධර්ම පොත් සහ සම්පත් වෙත පිවිසීමේ අවසරය E-TBN සපයයි.

# කොළඹ දේවධර්ම ශාස්ත්‍රාල මූලස්ථානයේ දී දේවධර්ම විශාරදයන් මුණගැසීම

### හිතෝපදේශය විමර්ශනය: ප්‍රඥා සාහිත්‍යය

පරණ ගිවිසුම පිළිබඳ විශාරද ආචාර්ය ප්‍රින්ස් කුමාර් තමිලරසන් සමඟ සම්මන්ත්‍රණයක්



ප්‍රඥා සාහිත්‍යය පොත් පිළිබඳ ගැඹුරු විචාරයක් තුළින්, ප්‍රඥා පොත් අගය කරමින්, සාරවත් අවබෝධයක් ලබා ගැනීමට දෙමළ මාධ්‍ය සිසුන්ට අවස්ථාව ලබා දෙන ලදී.

### අන්තර් සංස්කෘතික සන්දර්භය තුළ පරිවර්තනීය වැඩිහිටි අධ්‍යාපනය

දේවධර්මාචාර්ය සහ සහ අධ්‍යාපනඥ ආචාර්ය ඩෙබී ක්‍රැම්ලික් සමඟ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව



බහු-සංස්කෘතික පන්ති කාමරයක් තුළ, වැඩිහිටියන් සඳහා පරිවර්තනීය සහ අන්තර්ගත ඉගෙනීමේ අත්දැකීමක් නිර්මාණය කරන ආකාරය ශාස්ත්‍රපති උපාධි සිසුන්ට ඉගැන්වීම.

### ආදිකල්පික ඉතිහාසය: උත්පත්ති 1-11

පරණ ගිවිසුම පිළිබඳ විශාරද, ආචාර්ය හැවීලා ධර්මරාජ් සමඟ පූර්ව-ඉතිහාසය ගැන වෘත්තාන්තය අධ්‍යයනය



සියල්ලේ ආරම්භය, සහ මැවීම සහ මිනිසා, පාපය සහ එහි බලපෑම්, ගැළවීමේ ඉතිහාසය, භාෂාව සහ ජාතීන් යන මාතෘකා පෙළින් පෙළ අධ්‍යයනය කරමින්, ගවේෂණය කරන්නට ශාස්ත්‍රපති උපාධි සිසුන්ට අවස්ථාව ලැබිණි.

### මානව සංවර්ධනය සහ උපදේශනය

සභාපාලක, උපදේශක සහ පුහුණුකරු ආචාර්ය ඩේවිඩ් සී ගුඩ්වින් සමඟ මිනිසා සහ ඇදහිල්ලේ වර්ධනය පිළිබඳ බහුවිධ අධ්‍යයනයක්



ශාස්ත්‍රපති (උපදේශන) සිසුන්, සංවර්ධන අවශ්‍යතා සහ ජීවිතයේ අදියර අතර සංචලනය ගැන ඉගෙන ගන්නා අතරම, සම්පූර්ණත්වය කරා යාමට මිනිසුන්ට උපකාර කරන අන්දමත් අධ්‍යයනය කරන ලදී.

# කොළඹ දේවධර්ම ශාස්ත්‍රාල ප්‍රජාව




## දීර්ඝ කාලීන විශ්වාසවන්ත සේවා කාල සැමරීම

2023 වසර අවසාන වන විට, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දීර්ඝ කාලයක් සේවය කළ සාමාජිකයන් තිදෙනෙකුගේ විශ්වාසවන්ත භාරකාරත්වය සහ කැපවීම සමරන්නට හැකිවිය. ආචාර්ය අයිවෝ පූබාලන් විදුහල්පති ලෙස වසර 25ක් සම්පූර්ණ කළ අතර පීඨාධිපති දේවගැති රවීන් කල්දේරා (වමේ) සහ පරිපාලන නිලධාරී රොජර් ස්ලෙමමන් (දකුණේ) වසර 20ක් සම්පූර්ණ කළෝය.

## සමුදීම්



### බර්නාඩ් කොස්තා

බර්නාඩ් කොස්තා 2021 සිට ශාස්ත්‍රපති පාඨමාලා සම්බන්ධීකාරක ලෙස සේවය කළේය. ඔහුගේ නිල කාලය තුළ, තම නිහඬ ප්‍රඥාවෙන් සහ මෘදු ශක්තියෙන් ගුරු මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ සිසුන් මත නොමැකෙන සලකුණක් තබා ඇත. තම ජීවිත සහ සේවය කෙරෙහි ඔහුගේ බලපෑම ගැන සිසුන් ඉතා ඉහළින් කථා කරති. තම පන්ති කාමර තුළට ප්‍රබල නමස්කාර හැඟීමක් කාවැද්දීම බර්නාඩ්ගේ කල්පවත්නා දායාදයන්ගෙන් එකකි. බර්නාඩ් සහ ඔහුගේ පවුල පිලිපීනයේ, නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි පාසලේ සේවය කරන සහ ඉගෙන ගන්න අතර අපි ඔවුන්ට දෙවියන් වහන්සේගේ ආශීර්වද ප්‍රාර්ථනා කරමු.

### ජේසන් සෙල්වරාජා

ජේසන් 20 වසරකට වඩා කාලයක් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය හා සම්බන්ධව සිටියේය. සමඟ සම්බන්ධ වී ඇත. ගුරු මණ්ඩලයේ සාමාජිකයෙකු වීමට අමතරව, යාපනයේ පිහිටි කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ අධ්‍යයන මධ්‍යස්ථානයේ ප්‍රථම සම්බන්ධීකාරක ලෙස සේවය කරමින්, පළමු ප්‍රාදේශීය අධ්‍යයන වැඩසටහන ආරම්භ කිරීමට උපකාර කළේය. ඉදිරි කාලය තුළ ජේසන් විවිධාකාරයෙන් අඛණ්ඩව සභාවට සේවය කරන අතර අපි ඔහු සහ ඔහුගේ පවුල යාච්ඤාවෙන් ඔසවමු.




## කොළඹ දේවධර්ම ශාස්ත්‍රාල මූලස්ථානය

### විශ්වාසවන්ත සේවයේ සන්ධිස්ථාන සලකුණු කිරීම

මේ වසරේ මැයි 31 දිනට, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය වසර 30ක සේවාවක් සම්පූර්ණ කරයි. සිලෝන් බයිබල් විද්‍යාලයේ එකම අංශය ලෙස 1994 දී මෙහෙයුම් ආරම්භ කර, 1997 දී කොහුවල තමන්ට ම අයිති ස්ථානයකට කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය ගමන් කළ අතර, එම වසරේදිම, ප්‍රථම උපාධි ප්‍රදානෝත්සවයද සනිටුහන් කරන ලදි. පසුගිය වසර 30 පුරාවට කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ මූලස්ථානය බොහෝ වැදගත් සන්ධිස්ථාන සමරා ඇත. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය කෙරෙහි දෙවියන් වහන්සේගේ අනුග්‍රහය සහ ආශීර්වාද සමරන සන්ධිස්ථාන මතකයට නංවන අතර, අප සමඟ ගමන් කිරීමට අපි ඔබට ආරාධනා කරමු.



මූලස්ථාන පරිශ්‍රය 1997



ප්‍රථම උපාධි ප්‍රදානෝත්සවය 1997

**30 වසරක ගමනේ සන්ධිස්ථාන**

## ආසියානු දේවධර්ම සංගමය (ATA) බලය පිරිනැමීම යළි අලුත් කිරීම



ආසියානු දේවධර්ම සංගමය, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ අධ්‍යාපන වැඩසටහන් සඳහා, ඉදිරි වසර 5ක කාල පරිච්ඡේදය සඳහා නැවත බලය පිරිනමන ලදි. ආසියානු දේවධර්ම සංගමය නිල බලය පිරිනැමීමේ කණ්ඩායම (දකුණේ පෙනෙන) ආචාර්ය බෙනට් ලෝරන්ස් (කලාපීය ලේකම්, ආසියානු දේවධර්ම සංගමය), දේවගැති ප්‍රවීන්කුමාර් ඉශ්‍රායෙල් (සභාපති, ගෝලීය නායකත්ව සංවර්ධන කළමනාකරණ මධ්‍යස්ථානය, ඉන්දියාව) සහ ආචාර්ය හර්මන් ඇන්ඩ්‍රීසන් (නියෝජ්‍ය විදුහල්පති, ලංකා බයිබල් විද්‍යාලය සහ සෙමිනේරිය, ශ්‍රී ලංකාව) යන අයගෙන් සමන්විත විය.




## ආචාර්ය මනෝ ඉමෑනුවෙල්
## 2024 ආසියා පැසිෆික් සාම සම්මේලනයට

2024 ජනවාරි 23 සහ 24 පිලිපීනයේ, මැනිලාහිදී පැවති 2024 ආසියා පැසිෆික් සාම සම්මේලනයේ දී ශාස්ත්‍රීය ප්‍රවර්ධන ප්‍රධානී, මනෝ ඉමෑනුවෙල් සැසිවාරයක් මෙහෙයවූවාය.

## කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උතුරු කොළඹ මධ්‍යස්ථානය අලුත් තැනක

මැයි 14 වන දා උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානය, ස්තුති දීමේ සහ කැප කිරීමේ කාලයකට පසුව, දියත් කෙරිණි. එය පිටකොටුව, වේල්ල වීදියේ මෙතොදිස්ත සිටි මිෂන් ගොඩනැගිල්ලේ ඉහළ මහලේ පිහිටා තිබෙන අතර ඉඩකඩ ඇතිව, හොඳින් සකස් කළ පහසුකම් සහිත, ඉඩකඩ ඇති පන්ති කාමරයක් සහ පුස්තකාලයක් ඇත. වසර දොළහක්, උතුරු කොළඹ සහ හැඳල-වත්තල ඇදහිලිවතුන්ට කරන ලද සේවය දිගටම පවත්වාගෙන යෑමට බලාපොරොත්තු වෙයි.





### කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය වෙත දීම

**1 බැංකු ප්‍රේෂණ සහ විදේශ මුදල් යැවීම (ඇ.ඩො. සහ කැ.ඩො)**

වැඩි විස්තර සඳහා අප අමතන්න

**2 ණයවර පත (ක්‍රෙඩිට් කාඩ්)**

CTS වෙබ් අඩවිය හරහා ගෙවීම් කරන්නට

WWW.CTS.LK වෙත පිවිසෙන්න | පිටුවේ ඉහළ දකුණේ තිබෙන 'GIVE TO CTS' බොත්තම ඔබන්න | පරිත්‍යාග කරන්න

**3 චෙක්පත්**

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ **නමට ලියන්න** (ගෙවීම් ලබන්නා) විදුහල්පති, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය, 189, දුටුගැමුණු වීදිය, කොහුවල, ශ්‍රී ලංකාව **වෙත එවන්න**

**4 මුදල් ගෙවීම්**

කොහුවල කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය මූලස්ථානය වෙත පිවිසෙන්න

වැඩි විස්තර සඳහා සම්පත් සංවර්ධන කළමනාකාර, රොෂෙල් හේකල්-රණසිංහ අමතන්න
+94 77 350 2930 | ROCHELLE@CTS.LK

WWW.CTS.LK | +94 11 2890809